# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1644/10 – 2010 මාර්තු 09 වැනි අඟහරුවාදා – 2010.03.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: මහ/1/286/අත්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හේවාගම් කෝරළේ සුළු කොට්ඨාසයේ මාකුඹුර ගමෙහි පිහිටි කොළඹ දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මු.පි.කො. 9091 හා 2009.12.11 දිනැති පිඹුරෙහි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0265 ක් පමණ වූ පහත විස්තර සඳහන් ඉඩම් කැබලි දෙක (02) සඳහා මායිම්:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: බටදොඹගහදෙනිය කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: තිස්ස ප්‍රේමසිරි, මාකුඹුර, හිරිපිටිය, පන්නිපිටිය; ප්‍රමාණය: හෙක්. 0.0184.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: බටදොඹගහදෙනිය; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එම්. ඒ. ඥානවතී සහ තවත් අය, අංක 381/2, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය; ප්‍රමාණය: හෙක්. 0.0081.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 මාර්තු මස 22 වැනි දින පෙ.ව. 10.00ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2010 මාර්තු මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චන්ද්‍රරත්න පල්ලේගම,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2010 මාර්තු මස 03 වැනි දින,
මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 796